ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2020/03/31 |

## උද්ධමනය 2020 මාර්තු මාසයේ දී පහළ යන ලදී

**මතුපිට උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 5.4%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.7%
- මාසික වෙනස : -0.9%

**මූලික උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 2.9%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.9%
- මාසික වෙනස : 0.0%







කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 පෙබරවාරි මාසයේ පැවති සියයට 6.2හි සිට 2020 මාර්තු මාසයේ දී සියයට 5.4 දක්වා පහළ යන ලදී. මේ සඳහා, ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්වල සිදු වූ පහළ යෑම හේතු විය. ඒ අනුව, 2020 පෙබරවාරි මාසයේ දී සියයට 14.7හි පැවති ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය, 2020 මාර්තු මාසයේ දී සියයට 12.8 දක්වා පහළ යන ලදී. මේ අතර, ආහාර නොවන කාණ්ඩයෙහි 2020 මාර්තු මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය සියයට 2.5ක් විය.

එසේ වුවද, වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කො.පා.මි දර්ශකයෙහි වෙනස, 2020 පෙබරවාරි මාසයේ පැවති සියයට 4.6හි සිට 2020 මාර්තු මාසයේ දී සියයට 4.7 දක්වා ඉහළ ගියේය.

ආහාර කාණ්ඩයේ අයිතමවල මිලෙහි දක්නට ලැබුණු මිල පහළ යෑම හේතුවෙන් 2020 මාර්තු

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට -0.9ක් ලෙස වාර්තා විය. 2020 මාර්තු මාසයේ දී ආහාර කාණ්ඩයෙහි එළවළු, රතු ළූණු සහ පාන් මිල ගණන්වල පහළ යෑම් වාර්තා විය. එසේ වුවද, සෞඛ්‍ය (රුධිර පරීක්ෂණ ගාස්තු); සහ ප්‍රවාහන (ගුවන් ගමන් ගාස්තු) උප කාණ්ඩයන්හි අයිතමවල සිදු වූ මිල ඉහළ යෑම් හේතුවෙන්, ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ඉහළ යෑම් මෙම මාසය තුළ දක්නට ලැබුණි.

පසුගිය මාස හය තුළ දී අඛණ්ඩව පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2020 පෙබරවාරි මාසයේ දී පැවති සියයට 3.2හි සිට 2020 මාර්තු මාසයේ දී සියයට 2.9 දක්වා පහළ යන ලදී. මේ අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද 2020 පෙබරවාරි මාසයේ දී පැවති සියයට 5.1හි සිට 2020 මාර්තු මාසයේ දී සියයට 4.9 දක්වා මාස හතරක දී දක්නට ලැබුණු අවම අගය කරා පහළ යන ලදී.

**දත්ත ඇමුණුම**

**සංඛ්‍යා සටහන 01 : කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2018 | ජනවාරි | 122.8 | 125.6 | -0.1 | 0.6 | 5.8 | 3.5 | 6.6 | 5.6 |
| | පෙබරවාරි | 121.9 | 125.8 | -0.7 | 0.2 | 4.5 | 3.5 | 6.4 | 5.3 |
| | මාර්තු | 121.4 | 125.9 | -0.4 | 0.1 | 4.2 | 3.4 | 6.1 | 5.0 |
| | අප්‍රේල් | 121.5 | 126.2 | 0.1 | 0.2 | 3.8 | 3.5 | 5.9 | 4.7 |
| | මැයි | 122.9 | 126.4 | 1.2 | 0.2 | 4.0 | 3.2 | 5.7 | 4.5 |
| | ජුනි | 125.4 | 127.0 | 2.0 | 0.5 | 4.4 | 3.4 | 5.6 | 4.4 |
| | ජූලි | 125.8 | 127.3 | 0.3 | 0.2 | 5.4 | 3.9 | 5.6 | 4.3 |
| | අගෝස්තු | 125.8 | 127.5 | 0.0 | 0.2 | 5.9 | 3.7 | 5.6 | 4.1 |
| | සැප්තැම්බර් | 124.9 | 128.0 | -0.7 | 0.4 | 4.3 | 3.8 | 5.4 | 3.9 |
| | ඔක්තෝබර් | 124.6 | 128.1 | -0.2 | 0.1 | 3.1 | 3.8 | 5.0 | 3.8 |
| | නොවැම්බර් | 126.2 | 128.9 | 1.3 | 0.6 | 3.3 | 3.4 | 4.6 | 3.6 |
| | දෙසැම්බර් | 126.3 | 128.8 | 0.1 | -0.1 | 2.8 | 3.1 | 4.3 | 3.5 |
| 2019 | ජනවාරි | 127.4 | 132.5 | 0.9 | 2.9 | 3.7 | 5.5 | 4.1 | 3.7 |
| | පෙබරවාරි | 126.8 | 132.6 | -0.5 | 0.1 | 4.0 | 5.4 | 4.1 | 3.8 |
| | මාර්තු | 126.6 | 133.0 | -0.2 | 0.3 | 4.3 | 5.6 | 4.1 | 4.0 |
| | අප්‍රේල් | 127.0 | 133.1 | 0.3 | 0.1 | 4.5 | 5.5 | 4.1 | 4.2 |
| | මැයි | 129.0 | 134.2 | 1.6 | 0.8 | 5.0 | 6.2 | 4.2 | 4.4 |
| | ජුනි | 130.2 | 134.4 | 0.9 | 0.1 | 3.8 | 5.8 | 4.2 | 4.7 |
| | ජූලි | 130.0 | 134.6 | -0.2 | 0.1 | 3.3 | 5.7 | 4.0 | 4.8 |
| | අගෝස්තු | 130.1 | 134.6 | 0.1 | 0.0 | 3.4 | 5.6 | 3.8 | 5.0 |
| | සැප්තැම්බර් | 131.1 | 135.2 | 0.8 | 0.4 | 5.0 | 5.6 | 3.9 | 5.1 |
| | ඔක්තෝබර් | 131.3 | 135.2 | 0.2 | 0.0 | 5.4 | 5.5 | 4.0 | 5.3 |
| | නොවැම්බර් | 131.7 | 135.5 | 0.3 | 0.2 | 4.4 | 5.1 | 4.1 | 5.4 |
| | දෙසැම්බර් | 132.4 | 135.0 | 0.5 | -0.4 | 4.8 | 4.8 | 4.3 | 5.5 |
| 2020 | ජනවාරි | 134.6 | 136.5 | 1.7 | 1.1 | 5.7 | 3.0 | 4.5 | 5.3 |
| | පෙබරවාරි | 134.6 | 136.9 | 0.0 | 0.3 | 6.2 | 3.2 | 4.6 | 5.1 |
| | මාර්තු | 133.4 | 136.9 | -0.9 | 0.0 | 5.4 | 2.9 | 4.7 | 4.9 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව